# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2017 අංක 22 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 ඔක්තෝබර් මස 13 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2017 අංක 22 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී. — ඕ. 51/2017

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2017 අංක 22 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

1987 අංක 15 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාදේශීය සභාවල සංයුතිය.

4. (1) එක් එක් ප්‍රාදේශීය සභාවක් —

(අ) ඒ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සහ තෝරා යැවිය යුතු සභිකයන් සංඛ්‍යාවෙන් සියයට හැටකට සමාන වන, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඇ සහ 3ඈ වගන්ති යටතේ පළ කරන ලද නියමවල නිශ්චිතව දක්වා ඇති කොට්ඨාස සංඛ්‍යාව මත පදනම් වී, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන, සභිකයන් සංඛ්‍යාවකින්;

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තිය යටතේ තෝරා යැවිය යුතු සභිකයන් වන, ඒ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සහ තෝරා යැවිය යුතු සභිකයන් සංඛ්‍යාවෙන් සියයට හතළිහකට සමාන සභිකයන් සංඛ්‍යාවකින්; සහ

2—PL 010335 -2,862 (2017/09)

(ඇ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට හතළිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට හතළිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.